සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Sabaragamuwa Provincial Department Of Education**
சபரகமுவ மாகாணக்கல்வி திணைக்களம்

| | | |
|---|---|---|
| තෙවන වාර පරීක්ෂණය | 2020 | 11 ශ්‍රේණිය |
| மூன்றாம் தவணை பரீட்சை | 2020 | தரம் 11 |
| **Third Term Test** | **2020** | **Grade 11** |

| | |
|---|---|
| දෙවන බස - සිංහල II | පැය 02 |
| இரண்டாம் மொழி - சிங்களம் II | 2 மணித்தியாலம் |
| **Second Language – Sinhala** II | **Two Hour** |

- I කොටසේ අංක **1** හා **2** ඇතුළුව II කොටසින් **එක්** ප්‍රශ්නයක් ද III කොටසින් ප්‍රශ්න දෙකක් ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් උත්තර ලියන්න.
  பகுதி 1 இலிருந்து 1ஆம் 2ஆம் வினாக்களுக்கும் பகுதி இரண்டிலிருந்து ஏதாவது ஒரு வினாவிற்கும் பகுதி மூன்றிலிருந்து இரு வினாக்களுக்குமாக மொத்தம் 5 வினாக்களுக்கு மட்டும் விடை தருக.
  Answer only five questions including questions no. 1 and 2 in part I and selecting one question from the part II and two questions from part III.

## I කොටස / பகுதி I / Part I

1. දී ඇති මාර්ගෝපදේශය ආශ්‍රය කර ගනිමින් පහත දැක්වෙන මාතෘකාවලින් **එකක්** ගැන වචන **100ක** පමණ රචනයක් ලියන්න.
   தரப்பட்டுள்ள அறிவுறுத்தல்களுக்கேற்ப பின்வரும் தலைப்புக்களில் ஒன்றைத் தெரிவு செய்து 100 சொற்களில் அமையுமாறு கட்டுரை ஒன்று எழுதுக.
   Write an essay of about 100 words on any one of the following topics in accordance with the given guidelines.

(අ) අභය භූමියක සුන්දරත්වය.
(i) අභය භූමිය ගැන හැඳින්වීම
(ii) අභය භූමියක ලස්සන
(iii) අභය භූමියක ඇති වැදගත්කම
(iv) ආරක්ෂා කරගත හැකි ආකාරය
(v) සමාලෝචනය

(ආ) වැඩිහිටියන්ට ගරු කරමු.
(i) හැඳින්වීම
(ii) වැඩිහිටියන්ට වර්තමානයේ අත්වී ඇති තත්ත්වය
(iii) වැඩිහිටියන් වෙනුවෙන් කළ හැකි දේ
(iv) වැඩිහිටියන්ට ගරු කළ හැකි ආකාරය
(v) සමාලෝචනය

(ඉ) මත් උවදුර පිටුදකිමු.
(i) මත් ද්‍රව්‍ය පිළිබඳ හැඳින්වීම
(ii) එය උවදුරක් වන ආකාරය
(iii) භාවිත කරන අයට සිදු වන හානිය
(iv) වැළැකීමට ගත හැකි ක්‍රියාමාර්ග
(v) සමාලෝචනය

(ඊ) සුන්දර ශ්‍රීලංකාව.
(i) හැඳින්වීම
(ii) ලංකාවේ සුන්දරත්වය
(iii) වැදගත් ස්ථාන
(iv) රට වෙනුවෙන් අපට කළ හැකි දේ
(v) සමාලෝචනය

(උ) ගඟක් කතා කරයි.

(i) කල්පිත මාතෘකාවක් ලෙස සලකා රචනාවට සුදුසු පසුබිම සකසා ගැනීම


(ii) ගඟෙන් පරිසරය අලංකාර වන ආකාරය

(iii) ගඟෙන් මිනිසාට සැලසෙන සේවය

(iv) ගංගා ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම

(v) සමාලෝචනය (ලකුණු 20යි.)

2. දී ඇති පින්තූරය බලා අර්ථවත් වාක්‍ය **පහක්** ගොඩනගන්න.
(වාක්‍යයක අවම වශයෙන් වචන **හතරක්වත්** තිබිය යුතුය.)
தரப்பட்டுள்ள படத்தை அடிப்படையாகக் கொண்டு கருத்துள்ள ஐந்து வாக்கியங்கள் எழுதுக.
(ஒரு வாக்கியத்தில் குறைந்தபட்சம் நான்கு சொற்களாவது இருத்தல் வேண்டும்.)
Compose five meaningful sentences with reference to the given picture.
(There should be at least four words in a sentence.)



(ලකුණු 10යි.)

**II කොටස / பகுதி II / Part II**

- 3 හා 4 යන ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු සපයන්න.
3ஆம் 4 ஆம் வினாக்களுள் ஏதேனும் ஒரு வினாவுக்கு மாத்திரம் விடை எழுதுக.
From questions 3 and 4 answer only one question.

3. පහත සඳහන් කවි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.
பின்வரும் கவிதையை வாசித்து, அதன் கீழ் கேட்கப்பட்டுள்ள வினாவுக்கு விடை எழுதுக.
Read the following poem and answer the questions given.

මොනව ද මුත්තේ මොක ද කරන්නේ - මොකට ද ඔබ ඔය බිම හාරන්නේ
ඔබටත් ළමයෝ නොපෙනේ නොසිතමි - අඹ ඇටයක් සිටුවන්නට හාරමි
දුකසේ සිටුවා අඹ ඇටයක් අද - එක අඹයක්වත් කන්න ලැබේවි ද
මම ළමයෝ මින් අඹයක් නොපතමි - යුතුකම පමණක් ඉටුකොට තබනෙමි
තමන්ට නොලැබෙන දේකින් ලෝකෙට - කරන්න හැකි දේ නොම තේරෙයි මට
පුදුමයි ළමයෝ ඔබෙ ඔය අදහස - හැදුණොත් ඔහොමට ඔබට ම වෙයි දොස
පෙර උන් අය සිටවූ අඹ ගස්වල - පලයෙන් අපි කවුරුත් ලබනෙමු පල
අපෙන් පසුව එන අයටත් එම පල - ලැබෙන්න සැලසුම අපගේ යුතුකම
ඒ යුතුකම හොඳ හැටි දැනගත්තෙමි - ආයුබෝවන් මුත්තේ මම යන්නෙමි

1) මෙම සංවාදය ඇතිවන්නේ කවුරුන් අතර ද?
2) මුත්තා බිම හාරන්නේ ඇයි?
3) අපි කන්නේ කවුරුන් සිටවූ අඹ ගස්වල ගෙඩි ද?
4) මෙහි සඳහන් ලෙස අපගේ යුතුකම කුමක් ද?
5) පහත සඳහන් පදවලට සමාන පද ලියන්න.
   I. ගස -
   II. ළමයා -

4. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.
பின்வரும் உரைப்பகுதியை வாசித்து, அதன் கீழ் கேட்கப்பட்டுள்ள வினாவுக்கு விடை எழுதுக.
Answer the given questions with reference to the following paragraph.

සොබාදහමේ විශාල ම සත්වයා අලියා ය. ලෝකයේ අලි ප්‍රධාන වශයෙන් වර්ග දෙකකි. ඒ අප්‍රිකානු අලියා සහ ආසියානු අලියා ය. අපේ රටේ දක්නට ලැබෙන්නේ ආසියානු අලියා ය. ඉන්දියාව සුමාත්‍රාව මැලේසියාව වැනි රටවල ද ආසියානු අලි දක්නට ලැබේ. යාල , උඩවලව වනෝද්‍යානය, වස්ගමුව, සෝමාවතිය ජාතික වනෝද්‍යානය අලි නැරඹුම් ස්ථාන වේ. අලියා සම්පූර්ණයෙන් ම ශාකමත යැපේ. එසේ ම ජලයට ඉතාමත් ම ප්‍රියකරන සතෙකි. අලියා මිනිසාට මිතුරෙකු ලෙස සේවය කරයි. ඔහුගෙන් ප්‍රයෝජන බොහොමයකි. මේ වටිනා සත්වයා රැකබලා ගැනීම අපගේ යුතුකමකි.

I. සොබාදහමේ විශාල ම සත්වයා කවු ද?
II. ප්‍රධාන වශයෙන් ලෝකයේ අලි වර්ග කීය ද? එම අලි වර්ග නම් කරන්න.
III. ආසියානු අලියා දක්නට ලැබෙන රටවල් දෙකක් ලියන්න.
IV. අලි නැරඹිය හැකි වනෝද්‍යාන දෙකක් ලියන්න.
V. අලියා ගැන වාක්‍ය 02ක් ලියන්න. (ලකුණු 10යි.)

## III කොටස / பகுதி II / Part II

- 5 හා 6 යන ප්‍රශ්න දෙකට ම පිළිතුරු සපයන්න.
  5,6 ஆகிய இரண்டு வினாக்களுக்கும் விடை எழுதுக.
  answer both questions 5 and 6.

5. ඔබ පාසලේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය 2020.11.26 වන දින පෙ.ව.10.00 සිට ප.ව.2.00 දක්වා විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී පැවැත්වේ. මේ සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් කළාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා සහභාගී වේ. මෙම තොරතුරු අදාළ කර ගනිමින් ආරාධනා පත්‍රයක් සකස් කරන්න.

**නැතහොත්**
**Or**
**அல்லது**

ඔබගේ පාසල් ගොවිපොළේ වගා කිරීමට අවශ්‍ය බීජ වර්ග ගෙන්වා ගැනීම සඳහා ගන්නෝරුව කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයේ අලෙවි කළමනාකාරතුමා වෙත යැවීම සඳහා ලිපියක් ලියන්න. පාසල් කෘෂිකර්ම සංගමයේ ලේකම් ඔබයැයි සිතන්න.
(ලකුණු 10යි.)

6. පහත දැක්වෙන වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.
கீழே தரப்பட்டுள்ள தமிழ் / ஆங்கில வாக்கியங்களை சிங்களத்தில் மொழி பெயர்க்க.
Translate the following Tamil/ English sentences into Sinhala.

1. நாம் நூதனசாலையை பார்வையிட சென்றோம்.
2. நிமல் ஒன்பதாம் வகுப்பில் கல்வி கற்கின்றான்.
3. உங்கள் இரகசிய இலக்கத்தை உட்செலுத்தவும்.
4. யால சரணாலய பூமி ஒரு அழகான பிரதேசமாகும்.
5. வெள்ளத்தில் நீச்சல் செய்ய போக வேண்டாம்.

1. We went to visit the museum.
2. Nimal studies in grade 9.
3. Enter your pin number.
4. Yala sanctuary is a lovely place.
5. Don’t swim in the flood.

**නැතහොත්**

**Or**

**அல்லது**

පොතක් මිලදී ගැනීම සඳහා පොත්හලකට ගිය අවස්ථාවක ඔබ හා වෙළඳ සේවක අතර ඇතිවන කතාබහ ගොඩනගන්න.

I. ආරම්භය හා සුබපැතීම
II. කරුණු විමසීම
III. මිලගණන් විමසීම
IV. පොත මිලදී ගැනීම
V. ස්තුතිය

(ලකුණු 10යි.)